අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2003 අප්‍රේල්
General Certificate of Education (Adv. Level) Examination, April 2003
කෘෂි විද්‍යාව I/ පැ දෙකයි
Agricultural Science I/Two hours

වැදගත් : ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නො ලැබේ.

සැලකිය යුතුයි :
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න. ඉන් පසු ඒ අසල ම පහළින් ඇති අංක සහිත කොටුවේ ද අදාළ ලෙස අංක අඳුරු කිරීමෙන් විභාග අංකය දක්වන්න.
(iii) උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද පරෙස්සමෙන් කියවන්න.
(iv) 1 සිට 60 දක්වා වූ එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගෙන උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි අඳුරු කරන්න.

01 එක්තරා ගොවියෙකුට හිමි කුඹුරක් වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර 2540 ට වඩා ලැබෙන පහතරට ප්‍රදේශයක පිහිටා ඇත. ඔහුගේ කුඹුර අයත් වන කෘෂි දේශගුණික කලාපය වඩාත් හොඳින් දක්වෙනුයේ,
(1) IL_1 මගිනි. (2) WL_1 මගිනි. (3) WL_2 මගිනි. (4) WL_3 මගිනි. (5) DL_5 මගිනි.

02. මද සුළඟ
(A) බෝගයක ශුද්ධ ස්වීකරණ වේගය වැඩි කරයි.
(B) පත්‍ර ආසන්නයේ ඔක්සිජන් සාන්ද්‍රණය වැඩි කරයි.
(C) පරාගණයට උදව් වේ.
(D) පත්‍රවලට හානි සිදු කරයි.
ඉහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ,
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A සහ D පමණි.
(4) B සහ C පමණි. (5) B සහ D පමණි.

03. ත්‍රිගුණ ශාක
(1) බීජ රහිත කුඩා ඵල නිපදවයි.
(2) බීජ ස්වල්පයක් ඇති කුඩා ඵල නිපදවයි.
(3) බීජ ස්වල්පයක් ඇති විශාල ඵල නිපදවයි.
(4) බීජ රහිත විශාල ඵල නිපදවයි.
(5) සඳහා ඉහත කිසිවක් අදාළ නොවේ.

04. ක්ලෝරීන්
(1) සචල අත්‍යවශ්‍ය මහාමූලද්‍රව්‍යයක් සේ සැලකේ.
(2) සචල අත්‍යවශ්‍ය ක්ෂුද්‍රමූලද්‍රව්‍යයක් සේ සැලකේ.
(3) අචල අත්‍යවශ්‍ය මහාමූලද්‍රව්‍යයක් සේ සැලකේ.
(4) අචල අත්‍යවශ්‍ය ක්ෂුද්‍රමූලද්‍රව්‍යයක් සේ සැලකේ.
(5) අත්‍යවශ්‍ය නොවන මූලද්‍රව්‍යයක් සේ සැලකේ.

05. පොලිතීන් ගෘහ (Poly tunnels) තුළ දී ශාක අතු කැබලිවල මුල් ඇදීම ප්‍රවර්ධනය වනුයේ, ප්‍රධාන වශයෙන්,
(1) අධික ආර්ද්‍රතාව සහ අඩු ආලෝක තීව්‍රතාව නිසා ය.
(2) අඩු ආර්ද්‍රතාව සහ වැඩි ආලෝක තීව්‍රතාව නිසා ය.
(3) අධික ආර්ද්‍රතාව සහ ඉහළ උෂ්ණත්වය නිසා ය.
(4) අඩු ආර්ද්‍රතාව සහ පළිබෝධවලින් ආරක්ෂා වීම නිසා ය.
(5) ඉහළ උෂ්ණත්වය හා පළිබෝධ සහ රෝගවලින් ආරක්ෂාවීම නිසා ය.

06. එක්තරා ශාක හෝර්මෝනයක්, සෛල දික්වීම, සෛල විභාජනය, මුල් ඇතිවීම, පුෂ්පීකරණය සහ අග්‍රස්ථ ප්‍රමුඛතාව ප්‍රවර්ධනය කරයි. මෙම හෝර්මෝනය
(1) ඔක්සින් වේ. (2) ගිබරලින් වේ. (3) සයිටොකයිනින් වේ.
(4) ඇබ්සිසික් අම්ලය වේ. (5) එතිලීන් වේ.

07. ආහාරවලට ප්‍රතිඔක්සිකාරක ද්‍රව්‍ය එක් කරනුයේ,
(1) විටමින සහ ජලය ඉවත්වීම වැළැක්වීමට ය.
(2) විටමින සහ හෝර්මෝන ඉවත්වීම වැළැක්වීමට ය.
(3) මුඩුවීම සහ හෝර්මෝන ක්‍රියාකාරීත්වය වැළැක්වීමට ය.
(4) පළිබෝධ හානි සහ දුර්වර්ණ වීම වැළැක්වීමට ය.
(5) මුඩුවීම සහ දුර්වර්ණ වීම වැළැක්වීමට ය.

08. 4°C උෂ්ණත්වයක දී යෝගට් ගබඩා කර තබාගත හැකි කාලය
(1) දින 2 - 4 පමණ වේ. (2) දින 5 - 7 පමණ වේ. (3) දින 7 - 10 පමණ වේ.
(4) සති 2 පමණ වේ. (5) මාස 1 පමණ වේ.

• බීජයක අඩංගු ප්‍රධාන කොටස් පහත දක්වේ. අංක 9,10 සහ 11 ප්‍රශ්නවලට පිළිතුරුදීම සඳහා මේවා යොදාගන්න.
(A) බීජපත්‍ර
(B) බීජාග්‍රපය
(C) බීජමූලපය (Coleorhiza)
(D) බීජලපය (Hilum)
(E) බීජාවරණය
(F) භ්‍රෑණපෝෂය
(G) සේවනිය
(H) අනුද්වාරය

09. ඉහත දැක්වෙන කොටස්වලින්, කලලයෙහි කොටස් වනුයේ,
(1) A,B සහ C පමණි. (2) A,D සහ E පමණි. (3) A,F සහ G පමණි.
(4) A සහ H පමණි. (5) A සහ F පමණි.

10. ඉහත දැක්වෙන කොටස්වලින්, මාතෘ පටකයේ කොටසක් වනුයේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය. (5) F ය.

11. බීජ ජලය අවශෝෂණය කරනුයේ,
(1) B හරහා ය. (2) C හරහා ය. (3) D හරහා ය. (4) G හරහා ය. (5) H හරහා ය.

12. ද්විවාර්ෂික වල් මර්දනයට වඩාත් සුදුසු ක්‍රමය වනුයේ,
(1) වර්ෂා කාලය ආරම්භවීමට පෙර වල් පැළ පිලිස්සීම ය. (2) බෝග සිටුවීමට පෙර ස්පර්ශ වල්නාශක යෙදීම ය.
(3) බිම් සැකසීමට පෙර වල් ගැසීම ය. (4) වල් පැළවල ජීවන චක්‍රයේ පළමු වර්ෂයේ දී ගලවා දැමීම ය.
(5) ඉහත සඳහන් කිසිවක් නොවේ.

13. ශ්‍රී ලංකාවේ වාර්ෂික සාමාන්‍ය වී නිෂ්පාදනය හෙක්ටාරයකට කිලෝග්‍රෑම්
(1) 1800 - 2200 අතර වේ. (2) 2400 - 2800 අතර වේ. (3) 2900 - 3300 අතර වේ.
(4) 3600 - 4000 අතර වේ. (5) 4200 - 4600 අතර වේ.

14. ගොවිපොළ කළමනාකරුවෙකු හෙක්ටාර පහක භූමි ප්‍රමාණයක මුං හා බඩ ඉරිඟු වගා කිරීමට තීරණය කර ඇත. එක් එක් බෝගය වගා කළ යුතු බිම් ප්‍රමාණය තීරණය කිරීමේ මූලධර්මය වනුයේ,
(1) යෙදවුම් - යෙදවුම් සම්බන්ධතාවයයි. (2) යෙදවුම් - නිමැවුම් සම්බන්ධතාවයයි.
(3) යෙදවුම් - මිල සම්බන්ධතාවයයි. (4) නිමැවුම් - නිමැවුම් සම්බන්ධතාවයයි.
(5) නිමැවුම් - මිල සම්බන්ධතාවයයි.

15. ඊසාන දිග මෝසම් කාලය තුළ, අන්තර්-නිවර්තන අභිසාරී කලාපය
(1) ලංකාවේ දකුණු දෙසට විස්ථාපනය වේ. (2) ලංකාවේ උතුරු දෙසට විස්ථාපනය වේ.
(3) ලංකාවේ බටහිර දෙසට විස්ථාපනය වේ. (4) ලංකාවේ නැගෙනහිර දෙසට විස්ථාපනය වේ.
(5) වෙනස් නොවේ.

16. කාලගුණික මධ්‍යස්ථානයක දිනපතා දත්ත සටහන් කරනුයේ,
(1) පෙ.ව. 8.00 ට සහ ප.ව. 4.00 ට ය. (2) පෙ.ව. 9.00 ට සහ ප.ව. 4.00 ට ය. (3) පෙ.ව. 8.00 ට පමණි.
(4) පෙ.ව. 9.00 ට පමණි. (5) මධ්‍යාහ්න 12.00 ට පමණි.

17. පාංශු ව්‍යුහය විනාශ කරනුයේ,
(1) ශුන්‍ය බිම් සැකසීමේ දී ය. (2) අවම බිම් සැකසීමේ දී ය. (3) යටි පස ඇවිස්සීමේ දී ය.
(4) ගැඹුරු සී සෑමේ දී ය. (5) මඩ කිරීමේ දී ය.

18. බීජ ආවරණය (Seed Coating) කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ,
(1) බීජ සුප්තතාව ඉවත් කිරීමයි. (2) බීජ ජීවාණුහරණය කිරීමයි.
(3) ඒකාකාරී හැඩයකින් යුත් බීජ ලබා ගැනීමයි. (4) බීජ දැඩි බවට පත්කිරීමයි.
(5) බීජ ආමුඛලනය කිරීමයි.

19. එක්තරා ශාකයක පරාග, එම ශාකයේ ම හටගත් පුෂ්පවල පිහිටි කලංක මත දී ප්‍රරෝහණය නොවේ. මෙම තත්ත්වය හඳුන්වන්නේ
(1) ස්වඅසංගතිය යනුවෙනි. (2) ස්වපරාගණය යනුවෙනි. (3) ස්වවන්ධ්‍යතාව යනුවෙනි.
(4) ස්වයාමනය යනුවෙනි. (5) ස්වපරපෝෂිතාව යනුවෙනි.

20. පටක රෝපණයේ දී තල ප්‍රවාහ කැබිනෙට්ටුව භාවිත කරනුයේ,
(1) රෝපණ කුටියේ උෂ්ණත්වය සහ ආර්ද්‍රතාව පාලනය කිරීමට ය. (2) රෝපණ මාධ්‍යය සාදා ගැනීමට ය.
(3) රෝපණ මාධ්‍යයට පටක මාරු කිරීමට ය. (4) ඛනිජ ඉවත් කරන ලද ජලය ලබා ගැනීමට ය.
(5) රෝපණ කුටියට අවශ්‍ය තරම් ආලෝකය ලබා ගැනීමට ය.

21. මාරක සාධක ප්‍රවේණියේ දී F_2 ප්‍රජනිතයෙහි **අපේක්ෂිත** රූපානුදර්ශ අනුපාතය
(1) 2 : 1 වේ. (2) 3 : 1 වේ. (3) 9 : 7 වේ. (4) 13 : 3 වේ. (5) 15 : 1 වේ.

22. පැළ කිඩැවා අයත් වන ගෝත්‍රය
(1) ඩමෙප්ටෙරා වේ. (2) ඩික්ටියොප්ටෙරා වේ. (3) ඕතොප්ටෙරා වේ.
(4) හෙටරොප්ටෙරා වේ. (5) හෝමොප්ටෙරා වේ.

23. පහත දැක්වෙනුයේ ආරක්ෂිත කෘෂිකර්මයට (Protected agriculture) අදාළ ප්‍රකාශ කිහිපයකි.
(A) වර්තමානයේ ශ්‍රී ලංකාවේ බහුලව ම දැකිය හැකි ප්‍රචාරක ව්‍යුහය වන්නේ ලණු ගෘහයයි.
(B) උසස් තත්ත්වයේ කෘෂි නිෂ්පාදන ලබාගැනීමට ප්‍රචාරක ව්‍යුහ යොදාගනී.
(C) ආරක්ෂිත කෘෂිකර්මයේ දී අකලට වගා කිරීම කළ හැකි ය.

Scanned with CamScanner

ඉහත ප්‍රකාශවලින්, වඩාත් නිවැරදි වනුයේ,
(1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි. (4) A සහ C පමණි. (5) B සහ C පමණි.

24. පහත දක්වෙනුයේ බින්දුදය පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.
(A) ජලජිද්‍ර හරහා ජලය වෑස්සීම බින්දුදය ලෙස හඳුන්වයි. (B) සාමාන්‍යයෙන් බින්දුදය රාත්‍රී කාලයේ දී සිදු වේ.
(C) අවට පරිසරයේ ආර්ද්‍රතාව අඩු වූ විට බින්දුදය සිදු වේ.
ඉහත ප්‍රකාශවලින් වඩාත් නිවැරදි වනුයේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A සහ B පමණි. (5) A සහ C පමණි.

25. අන්තර්ජාතික පාංශු විද්‍යා සංගමයේ (ISSS) පස් අංශු ප්‍රමාණ වර්ගීකරණයට අනුව, රොන් මඩ අංශුවල ප්‍රමාණය (විෂ්කම්භය මිලිමීටර) වනුයේ
(1) < 0.002 ය. (2) 0.2 - 0.02 ය. (3) 0.01 - 0.002 ය. (4) 0.2 - 0.01 ය. (5) 0.02 - 0.002 ය.

26. පසක වැලි, රොන් මඩ සහ මැටි යන කොටස්වල සාපේක්ෂ ප්‍රතිශතවල ව්‍යාප්තිය මගින් වඩාත් හොඳින් විස්තර කරනුයේ එම පසෙහි
(1) ව්‍යුහය වේ. (2) වයනය වේ. (3) සත්‍ය සනත්වය වේ.
(4) කැටිතිවල ස්ථායිතාව වේ. (5) සිදුරු අනුපාතය වේ.

27. ආන්තික උපයෝගිතාව හා මුළු උපයෝගිතාව අතර සම්බන්ධතාව වඩාත් හොඳින් විස්තර කෙරෙන්නේ මුළු උපයෝගිතාව වැඩිවන විට ආන්තික උපයෝගිතාව,
(1) නියත වේගයකින් වැඩිවන ලෙස ය. (2) වැඩිවන වේගයෙන් වැඩිවන ලෙස ය.
(3) ක්‍රමයෙන් අඩුවන ලෙස ය. (4) ඒකීය වේගයකින් වැඩිවන ලෙස ය.
(5) පළමු ව වැඩි වී පසුව අඩුවන ලෙස ය.

28. සාමාන්‍ය නිෂ්පාදනය,
(1) එක්තරා යෙදවුම් මට්ටමක දී ලබාගන්නා නිෂ්පාදනය ලෙස අර්ථ දැක්වේ.
(2) එක්තරා යෙදවුම් මට්ටමක දී එක් යෙදවුමක් සඳහා ලබාගන්නා නිෂ්පාදනය ලෙස අර්ථ දැක්වේ.
(3) විචල්‍ය යෙදවුම් භාවිත කිරීමෙන් ලබාගන්නා නිෂ්පාදනය ලෙස අර්ථ දැක්වේ.
(4) ස්ථාවර යෙදවුම් භාවිත කිරීමෙන් ලබාගන්නා නිෂ්පාදනය ලෙස අර්ථ දැක්වේ.
(5) සියලු ම යෙදවුම් භාවිත කිරීමෙන් ලබාගන්නා නිෂ්පාදනය ලෙස අර්ථ දැක්වේ.

29. කිකිළියකගේ ලගාජුර, ආහාර
(1) පැසීම සිදුවන ස්ථානය වේ. (2) ගබඩා වන ස්ථානය වේ.
(3) රසායනික ජීරණය සිදුවන ස්ථානය වේ. (4) යාන්ත්‍රික ජීරණය සිදුවන ස්ථානය වේ.
(5) ජීරණය හා අවශෝෂණය සිදුවන ස්ථානය වේ.

30. එළදෙනකගේ ඩිම්බ සංසේචනය සිදුවනුයේ,
(1) යෝනියේ දී ය. (2) ගර්භාෂ ග්‍රීවයේ දී ය. (3) පැලෝපීය නාලයේ දී ය.
(4) ගර්භාෂයේ ඉහළ කොටසේ දී ය. (5) ගර්භාෂයේ පහළ කොටසේ දී ය.

31. ගොවිපොළ සතුන්ගේ කුර සහ මුඛ රෝගයේ හේතු කාරක ජීවියා / ජීවීන්
(1) බැක්ටීරියාවකි. (2) වයිරසයකි. (3) දිලීරයකි.
(4) කෘමියෙකි. (5) ඉහත දක්වන සියල්ල ම වේ.

32. කිරි එරීමට බලපාන හෝර්මෝනය
(1) ප්‍රොජෙස්ටරෝන් ය. (2) ඊස්ට්‍රජන් ය. (3) රිලැක්සින් ය.
(4) ටෙස්ටොස්ටෙරෝන් ය. (5) ඩයිඊතිල් ස්ටිල්බෙස්ට්‍රෝල් ය.

33. ගැහැනු එළුවාගේ මද චක්‍රයේ දිග
(1) දින 15 කි. (2) දින 18 කි. (3) දින 21 කි. (4) දින 24 කි (5) දින 30 කි.

34. මී කිරිවල මේදයෙහි වර්ණය
(1) සුදු පාට වේ. (2) කහ පාට වේ. (3) සුදු පාට හෝ කහ පාට වේ.
(4) ගව ආහාර මත රඳා පවතී. (5) මීගව වර්ගය මත රඳා පවතී.

35. කිරිවල ප්‍රධාන සංඝටකය
(1) ප්‍රෝටීන වේ. (2) මේදය වේ. (3) ජලය වේ.
(4) ඛනිජ වේ. (5) කිරි වර්ගය අනුව වෙනස් වේ.

36. පීත දේහය මගින් ස්‍රාවය කරන හෝර්මෝනය
(1) ප්‍රොජෙස්ටරෝන් වේ. (2) ඊස්ට්‍රජන් වේ. (3) රිලැක්සින් වේ.
(4) ටෙස්ටොස්ටෙරෝන් වේ. (5) ඩයිඊතයිල් ස්ටිල්බෙස්ට්‍රෝල් වේ.

Scanned with CamScanner

37. බීජ ප්‍රරෝහණ පරීක්ෂණයක දී බීජ 400 ක් ප්‍රරෝහකයක (Germinator) තැන්පත් කරන ලදී. දින 4 - 5 කට පසුව, පැළවුණු බීජ ප්‍රමාණය බීජ 352 ක් බව සොයාගන්නා ලදී. බීජ සාම්පලයේ ප්‍රරෝහණ ප්‍රතිශතය වනුයේ,
(1) 12% කි. (2) 13.6% කි. (3) 86.4% කි. (4) 88% කි. (5) 100% කි.

38. ප්‍රදේශයක දෛනික වාෂ්පීකරණ උත්ස්වේදනය මිලිමීටර 3.0 කි. එම ප්‍රදේශයේ හෙක්ටාර 2 ක භූමි ප්‍රමාණයක වගාකරන ලද මිරිස් බෝගයකට දෛනිකව යෙදිය යුතු අවම වාරි ජල පරිමාව වනුයේ,
(1) 0.06 m^3 (2) 0.60 m^3 (3) 6.00 m^3 (4) 60.0 m^3 (5) 600 m^3

39. එක්තරා ප්‍රදේශයක එක්තරා දිනයක වර්ෂාපතනය සෙන්ටිමීටර 7.0 කි. විෂ්කම්භය සෙන්ටිමීටර 10 ක් වූ වර්ෂාමානයක මෙදින එකතු වූ වැසි ජල පරිමාව වනුයේ,
(1) 55.68 cm^3 (2) 220 cm^3 (3) 440 cm^3 (4) 550 cm^3 (5) 2200 cm^3

40. භූමියෙන් නොවෙනස් ව ගන්නා ලද පාංශු නියැදියක (Undisturbed soil sample) පරිමාව 300 cm^3 වේ. නියත බරක් ලැබෙනතුරු උඳුනක වියලූ පසු එම නියැදියේ බර 420 g විය. පාංශු නියැදියේ දෘශ්‍ය ඝනත්වය වනුයේ,
(1) 0.28 g/ cm^3 (2) 0.40 g / cm^3 (3) 0.71 g/ cm^3
(4) 1.40 g / cm^3 (5) 1.71 g/ cm^3

41. ආහාර කල්තබා ගැනීමට ශීත කිරීම (Freezing) උපකාරී වනුයේ,
(A) ක්ෂුද්‍ර ජීවීන්ගේ වර්ධනය අඩු කිරීම මගිනි.
(B) ක්ෂුද්‍ර ජීවීන් විනාශ කිරීම මගිනි.
(C) ජල ක්‍රියාකාරීත්වය අවම කිරීම මගිනි.
(D) ලබාගත හැකි පෝෂක අවම කිරීම මගිනි.

ඉහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ,
(1) A සහ B පමණි. (2) B සහ C පමණි.
(3) A සහ C පමණි. (4) A,B සහ C පමණි.
(5) A,B,C සහ D යන සියල්ල ම වේ.

42. පහත දක්වෙනුයේ ආහාර සහ පෝෂණයට අදාළ වූ ප්‍රකාශ කිහිපයකි.
(A) සත්ත්ව ප්‍රෝටීනවල සියලු ම අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල අඩංගු වේ.
(B) ශාක මේදයේ සත්ත්ව මේදයට වඩා අසංතෘප්ත මේද අම්ල අඩංගු වේ.
(C) මාංශවල වැඩි යකඩ ප්‍රමාණයක් අඩංගු වේ.
(D) ශාක සම්භවයක් ඇති ආහාරවල ජීරකතාව සත්ත්ව සම්භවයක් ඇති ආහාරවලට වඩා වැඩිය.

ඉහත ප්‍රකාශවලින් වඩාත් නිවැරදි වනුයේ,
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි.
(4) A,B සහ C පමණි. (5) A,B,C සහ D යන සියල්ලම වේ.

43. පිතෙහි ප්‍රධාන කෘත්‍යය වනුයේ,
(1) කාබොහයිඩ්‍රේට ජීරණය කිරීම ය. (2) ප්‍රෝටීන ජීරණය කිරීම ය.
(3) මේද ජීරණය කිරීම ය. (4) මේද අවශෝෂණය කිරීම ය.
(5) මේද සමජාතිකරණය (Homogenise) කිරීම ය.

44. සමහරක් ගව වර්ගවල දක්නට ලැබෙන මොල්ලිය හා තැල්ලෙහි ප්‍රධාන කාර්යය වනුයේ,
(1) ජලය ගබඩා කිරීම ය. (2) බාහිර ස්වරූපය වැඩිදියුණු කිරීම ය.
(3) මතුපිට ක්ෂේත්‍රඵලය ඉහළ දැමීම ය. (4) මේද සංචිත කිරීම ය.
(5) ඉහත සඳහන් කිසිවක් නොවේ.

45. පලතුරු මගින් මනුෂ්‍ය ආහාරයට ප්‍රධාන වශයෙන් සපයනු ලබන්නේ,
(1) ජලය, කාබෝහයිඩ්‍රේට සහ තන්තු වේ. (2) ජලය, ප්‍රෝටීන සහ තන්තු වේ.
(3) විටමින්, ප්‍රෝටීන සහ තන්තු වේ. (4) විටමින්, කාබෝහයිඩ්‍රේට සහ ඛනිජ වේ.
(5) විටමින්, ප්‍රෝටීන සහ ඛනිජ වේ.

46. වියළි කලාපයේ වාර්ෂික උපරිම වර්ෂාපතනය සහ වසරක දී වර්ෂාව රහිත ආසන්න දින සංඛ්‍යාව පිළිවෙළින්
(1) මිලිමීටර 2500 සහ දින 220 ක් වේ. (2) මිලිමීටර 2500 සහ දින 145 ක් වේ.
(3) මිලිමීටර 1750 සහ දින 220 ක් වේ. (4) මිලිමීටර 1750 සහ දින 145 ක් වේ.
(5) මිලිමීටර 1500 සහ දින 180 ක් වේ.

47. බිම් සැකසීම.
(1) ජල සන්නායකතාව, දෘශ්‍ය ඝනත්වය සහ අහඹු රළු බව වැඩි කරන අතර සංතෘප්ත අවස්ථාවේ පවතින පාංශු ජල ප්‍රමාණය අඩු කරයි.
(2) ජල සන්නායකතාව, දෘශ්‍ය ඝනත්වය සහ සංතෘප්ත අවස්ථාවේ පවතින පාංශු ජල ප්‍රමාණය වැඩි කරන අතර අහඹු රළු බව අඩුකරයි.
(3) ජල සන්නායකතාව, අහඹු රළු බව සහ සංතෘප්ත අවස්ථාවේ පවතින පාංශු ජල ප්‍රමාණය වැඩි කරන අතර දෘශ්‍ය ඝනත්වය අඩු කරයි.
(4) දෘශ්‍ය ඝනත්වය, අහඹු රළු බව සහ සංතෘප්ත අවස්ථාවේ පවතින පාංශු ජල ප්‍රමාණය වැඩි කරන අතර ජල සන්නායකතාව අඩු කරයි.
(5) දෘශ්‍ය ඝනත්වය සහ අහඹු රළු බව වැඩි කරන අතර ජල සන්නායකතාව සහ සංතෘප්ත අවස්ථාවේ පවතින පාංශු ජල ප්‍රමාණය අඩු කරයි.

48. ගැඹුරු සී සෑම
(1) අස්වැන්න වැඩි කරයි. බහුවාර්ෂික වල් පැළ පාලනය කරයි. නමුත් පසේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව අඩු කරයි.
(2) අස්වැන්න සහ පසේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව වැඩි කරන අතර බහුවාර්ෂික වල් පැළ පාලනය කරයි.
(3) පසේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව ඉහළ නංවන අතර බහුවාර්ෂික වල් පැළ පාලනය කරයි. නමුත් අස්වැන්න අඩු කරයි.
(4) අස්වැන්න සහ පසේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව වැඩි කරන නමුත් බහු වාර්ෂික වල් පැළ මර්දනය නොකරයි.
(5) අස්වැන්න සහ පසේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව අඩු කරන අතර බහු වාර්ෂික වල් පැළ පාලනය කරයි.

49. අවම බිම් සැකසීම.
(A) රළු වයනයක් සහිත පසකට වඩා යෝග්‍යයි.
(B) පාංශු ඛාදනය අඩු කරයි.
(C) කාබනික ද්‍රව්‍ය වියෝජනය කරන වේගය වැඩි කරයි.
ඉහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ,
(1) A පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි.
(4) A සහ B පමණි. (5) A,B සහ C යන සියල්ලම වේ.

50. බෝගයක ඉහළ ම බෝග සංගුණකය දක්නට ලැබෙනුයේ එම බෝගයේ
(1) පැළ අවස්ථාවේ දී ය. (2) ක්‍රියාකාරී වර්ධක අවස්ථාවේ දී ය. (3) ප්‍රජනක අවස්ථාවේ දී ය.
(4) පරිනත අවස්ථාවේ දී ය. (5) පැළ සහ පරිනත යන අවස්ථාවල දී ය.

51. ගොවියෙකු තම එළවළු වගාවෙහි මෘදු කුණුවීමේ තත්ත්වයක් (Soft-rot condition) වර්ධනය වන බව නිරීක්ෂණය කළේය. ඔහු රෝගයට පාත්‍ර වූ ශාකයක කඳ කොටසක් කපා ජලය වීදුරුවක තැබූ පසු, කඳේ කපන ලද මතුපිටෙන් ස්‍රාවයක් පිටවන බව නිරීක්ෂණය කළේ ය. මෙම රෝගයට හේතුකාරකය වනුයේ
(1) නෙමටෝඩාවන් ය. (2) දිලීර ය. (3) වයිරස් ය.
(4) ප්‍රොටොසෝවාවන් ය. (5) බැක්ටීරියාවන් ය.

52. මූල පීඩනය පිළිබඳ ව වඩාත් ම නිවැරදි වගන්තිය වනුයේ,
(1) පොටෑසියම් සයනයිඩ් යෙදීමෙන් මූල පීඩනය වැඩි වේ.
(2) මූල කලාපයේ ඔක්සිජන් අඩුවීම, මූල පීඩනය අඩු කරයි.
(3) මූල පද්ධතියේ පරිවෘත්තික ක්‍රියාවලිය මූල පීඩනයට බලපෑමක් ඇති නොකරයි.
(4) උත්ස්වේදන චූෂණය සමග මූල පීඩනය වැඩිවෙයි.
(5) උස් ශාකවල ජල පරිවහනයේ ප්‍රධාන බලය වනුයේ මූල පීඩනයයි.

• අංක 53 හා 54 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත රූප සටහන යොදා ගන්න.

53. A සහ B යන සමෝච්ඡ කානු දෙක අතර සාමාන්‍ය සිරස් උස වනුයේ,
(1) මීටර 3.5 කි. (2) මීටර 3.0 කි. (3) මීටර 2.5 කි. (4) මීටර 2.0 කි. (5) මීටර 1.5 කි.



54. ඉහත රූප සටහනේ "C" අක්ෂරයෙන් දැක්වෙන ව්‍යුහය ප්‍රධාන වශයෙන් භාවිත කරන්නේ
(1) අපධාව වන ජලය වහනය කිරීමට ය.
(2) භූගත ජලය ලබා ගැනීමට ය.
(3) පස් සහ ජලය සංරක්ෂණය කිරීමට ය.
(4) පොහොර යෙදීමට ය.
(5) බෝග සිටුවීමට ය.

55. ශාකවල සල්ෆර් ඌනතා ලක්ෂණය/ලක්ෂණ වනුයේ
(1) පළමුව මේරූ පත්‍රවල දක්නට ලැබෙන හරිතක්ෂ තත්ත්වය වේ.
(2) මේරූ පත්‍රවල ඇතිවන අන්තර් නාරටි හරිතක්ෂය වේ.
(3) පළමු ව ලපටි පත්‍රවල දක්නට ලැබෙන හරිතක්ෂ තත්ත්වය වේ.
(4) රැළි සහිත පත්‍ර අඩංගු කුරු ශාක වේ.
(5) ලපටි පත්‍රවල ඇති පිලිස්සුණු පත්‍ර දාර සහ නෙක්‍රොසිය ලප වේ.

56. පත්‍රවල ඇන්තොසයනින් වර්ණකය වර්ධනය වීම දක්නට ලැබෙන්නේ
(1) N ඌනතාවය හේතුවෙනි. (2) Zn ඌනතාවය හේතුවෙනි. (3) Mg ඌනතාවය හේතුවෙනි.
(4) P ඌනතාවය හේතුවෙනි. (5) Ca ඌනතාවය හේතුවෙනි.

57. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ දක්නට ලැබෙන ප්‍රධාන පාංශු කාණ්ඩ වනුයේ,
(1) රතු දුඹුරු පස් සහ දියළු පස් වේ.
(2) දියළු පස් හා ලවණ පස් වේ.
(3) චූර්ණමය නොවන ලෝම පස් සහ රතු කහ ලැටසෝල් පස් වේ.
(4) රතු කහ පොඩ්සොලික් පස් සහ දියළු පස් වේ.
(5) රතු කහ ලැටසෝල් පස් සහ රෙගොසෝල් පස් වේ.

58. පහත දැක්වෙන ප්‍රකාශ පාෂාණ සම්බන්ධයෙන් වේ.
(A) මැග්මා ඝනවීමෙන් ආග්නේය පාෂාණ ඇතිවේ.
(B) ජලය සහ සුළඟේ ක්‍රියාවලි මගින් විපරීත පාෂාණ සෑදේ.
(C) ආග්නේය සහ විපරීත පාෂාණවල තැන්පතු මගින් අවසාදිත පාෂාණ ඇතිවෙයි.
(D) ලාවා ඝන වීමෙන් විපරීත පාෂාණ ඇතිවේ.

ඉහත ප්‍රකාශවලින් වඩාත් නිවැරදි වනුයේ
(1) A සහ C පමණි. (2) A සහ B පමණි. (3) B සහ C පමණි.
(4) C සහ D පමණි. (5) A සහ D පමණි.

59. පෘථිවි කබොල්ලේ වඩාත් ම බහුලව ඇති මූලද්‍රව්‍ය හතර වනුයේ,
(1) කාබන්, සිලිකන්, යකඩ සහ කැල්සියම් (2) ඔක්සිජන්, සිලිකන්, යකඩ සහ මැග්නීසියම්
(3) සිලිකන්, ඔක්සිජන්, ඇලුමිනියම් සහ යකඩ (4) ඇලුමිනියම්, යකඩ, මැග්නීසියම් සහ ඔක්සිජන් ය.
(5) කාබන්, මැග්නීසියම්, යකඩ සහ සිලිකන් ය.

60. සූක්ෂ්ම එළවළු බෝග වගා කරන බිමක ඇති ප්‍රධාන භූගත ජල දූෂණකාරක වනුයේ
(1) පොස්පේට් සහ පළිබෝධනාශක වේ. (2) පළිබෝධනාශක සහ නයිට්‍රේට වේ.
(3) ඇමෝනියම් නයිට්‍රජන් සහ ෆොස්ෆේට් වේ. (4) කැල්සියම් සහ ෆොස්ෆේට් වේ.
(5) ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය වේ.

❀❀❀ ❀❀ ❀❀❀

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2003 අප්‍රේල්
General Certificate of Education (Adv. Level) Examination, April 2003
කෘෂි විද්‍යාව II/පැ තුනයි
Agricultural Science II/Three hours

මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යන කොටස් දෙකකින් යුක්ත වේ. කොටස් දෙකට ම නියමිත කාලය පැ තුනයි.

A කොටස ව්‍යුහගත රචනා : සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න. ඔබේ පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද, දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

B කොටස රචනා : ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු "A" සහ "B" කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ "A" කොටස උඩින් තිබෙන පරිදි අමුණා, විභාග ශාලාධිපතිට භාරදෙන්න.
ප්‍රශ්න පත්‍රයේ "B" කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට අවසර ඇත.

"A" කොටස - ව්‍යුහගත රචනා
සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 10 කි)

01. (A) ශිෂ්‍ය කණ්ඩායමකට තම පාසල තුළ කාලගුණ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට අවශ්‍ය වී ඇත.

(i) යෝජිත කාලගුණ මධ්‍යස්ථානය හා පාසල් ගොඩනැගිලි, උස ගස් ආදිය අතර තිබිය යුතු අවම දුර ප්‍රමාණය කොපමණද ?

....

(ii) ඔබ තෝරාගත් ස්ථානයේ භූමිය මතුපිට සකස් කරන්නේ කෙසේ ද?

....

....

(iii) බිම් මට්ටමේ සිට වර්ෂාමානයේ මුඳුන් දාරයට උස කොපමණ විය යුතු ද?

....

(iv) උපරිම හා අවම උෂ්ණත්වමාන සහ තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමාන ස්ටීවන්සන් ආවරණය තුළ තැබිය යුත්තේ ඇයි?

....

....

(v) පහත උපකරණවලින් මනිනු ලබන කාලගුණික සාධක කවරේ ද?

(1) සූර්ය විකිරණමානය ....

(2) සූර්ය දීප්තමානය ....

(B) (i) වාර්ෂික වර්ෂාපතනය පදනම් කොටගෙන ශ්‍රී ලංකාව ප්‍රධාන කලාප තුනකට බෙදා ඇත. මෙම කලාප තුන නම් කර, එක් එක් කලාපයට අදාළ වාර්ෂික වර්ෂාපතන පරාසය දක්වන්න.

කලාපය	වාර්ෂික වර්ෂාපතන පරාසය (මිලිමීටර)
(1)	....
(2)	....
(3)	....

(ii) ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප කොපමණ සංඛ්‍යාවක් තිබේ ද?

....

(C) ශිෂ්‍යයෙකු විසින් බිම් සැකසීමට පෙර හා පසුව එක්තරා පසක සමහර ගුණාංග මනින ලදී. ඔහුගේ දත්ත පහත පරිදි වේ.

පාංශු ගුණාංගය	බිම් සැකසීමට පෙර	බිම් සැකසීමට පසු
ජල සන්නායකතාවය (පැයට සෙන්ටිමීටර)	16.48	23.18
අහඹු රළු බව (සෙන්ටිමීටර)	1.08	1.86
සංතෘප්ත අවස්ථාවේ දී පාංශු ජලය (%)	30.00	40.00
දෘශ්‍ය ඝනත්වය (ග්‍රෑම් /ඝන සෙන්ටිමීටර)	1.43	1.13

මාස්ටර් ගයිඩ් ප්‍රකාශනයකි
Scanned with CamScanner

02.

(i) බිම් සැකසීම මගින්, පසක ජල සන්නායකතාව වැඩි වන්නේ කෙසේ ද?

....

....

(ii) බිම් සැකසීම මගින් පසක අහඹු රළු බව වැඩිවීමේ කෘෂිකාර්මික වැදගත්කම කුමක් ද?

....

....

(iii) ඉහත පසෙහි බිම් සැකසීමට පෙර හා පසු, පාංශු ජලය සංතෘප්ත අවස්ථාවේදී පස් නියැදි ලබාගන්නා ලදී. ඉන්පසු මෙම නියැදි පැය 24 ක කාලයක් ජලවහනය වීමට තබන ලදී. එවිට එක් එක් පස් නියැදියේ තිබූ ජලයෙන් 40% ක් ඉවත් විය. ක්ෂේත්‍ර ධාරිතාවේ දී එක් එක් පස් නියැදියේ ඇති ජලය ප්‍රමාණය ගණනය කරන්න.

(1) බිම් සැකසීමට පෙර ලබාගත් පස් නියැදිය.

....

....

(2) බිම් සැකසීමෙන් පසු ලබාගත් පස් නියැදිය.

....

....

(D) (i) "බෝග ජල අවශ්‍යතාව" අර්ථ දක්වන්න.

....

....

....

(ii) බෝග ජල අවශ්‍යතාව ඇස්තමේන්තු කිරීමේ දී සලකා බලනු ලබන ප්‍රධාන සාධක තුන කවරේ ද?

(1) ....

(2) ....

(3) ....

(iii) "සඵල වර්ෂාපතනය" අර්ථ දක්වන්න.

....

....

....

(iv) සඵල වර්ෂාපතනයට බලපාන ප්‍රධාන සාධක **තුනක්** නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(v) වාරි ජලය අපතේ යන ආකාර **තුනක්** නම් කර, එම එක් එක් ආකාරයේ අපතේ යාම අවම කර ගත හැකි ක්‍රමයක් බැගින් නම් කරන්න.

අපතේ යන ආකාරය	අපතේ යාම අවම කරන ක්‍රමය
(1)	....
(2)	....
(3)	....

මාස්ටර් ගයිඩ් ප්‍රකාශනයකි
Scanned with CamScanner

02. (A) ප්‍රශ්න අංක (i) සිට (iii) දක්වා පිළිතුරු සැපයීමට පහත රූප සටහන භාවිත කරන්න.



(i) ඉහත රූප සටහනේ දැක්වෙන උපකරණය නම් කරන්න.

....

(ii) පාංශු හා ජල සංරක්ෂණය සඳහා ඉහත රූප සටහනේ දැක්වෙන කුඤ්ඤ පේළිය දිගේ සකස් කිරීමට සුදුසු ව්‍යූහ **තුනක්** නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(iii) කුඤ්ඤ පේළිය දිගේ වගා කිරීමට සුදුසු ශාක විශේෂ **දෙකක්** නම් කරන්න.

(1) ....

(2) ....

(B) ගොවියෙක් උඩරට ප්‍රදේශයේ කැපූ මල් වගාවක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබේ.

(i) ඔහුගේ වගාවට සුදුසු ශාක ප්‍රචාරක ව්‍යූහයක් නම් කරන්න.

....

(ii) ඉහත ව්‍යූහය තෝරා ගැනීමට ප්‍රධාන හේතුවක් දක්වන්න.

....

....

(iii) පහතරට තත්ත්ව යටතේ ඉහත ව්‍යූහය භාවිත කිරීමේ දී මුහුණ දීමට සිදුවන ප්‍රධාන **අවාසිය** කුමක්ද ?

....

....

(iv) පහතරට තත්ත්වවලට ගැළපෙන පරිදි, ඔබ මෙම ව්‍යූහය නවීකරණය කරන්නේ කෙසේ ද?

....

....

(C) ගොවියෙක් සිය ගෙවත්තේ කොම්පෝස්ට් ගොඩක් සෑදීම සඳහා පිදුරු, වල් පැළ, ලී කුඩු හා දර අළු එකතු කර ගන්නා ලදී.

(i) හොඳ ගුණාත්මයෙන් යුත් කොම්පෝස්ට් සෑදීම සඳහා ඔහුට අවශ්‍ය තවත් සංඝටක **දෙකක්** නම් කරන්න.

(1) .... (2) ....

(ii) කොම්පෝස්ට් සෑදීමේ දී ලී අළු යොදා ගැනීමේ ප්‍රධාන වාසිය කුමක් ද?

....

....

Scanned with CamScanner

(iii) කොම්පෝස්ට් ගොඩ ඇසිරීමෙන් පසු ඔහු එය මතුපිට පස් තට්ටුවකින් වසන ලදී. ඔහු එසේ කළේ ඇයි ?

....

....

(iv) නිශ්චිත කාලාන්තර සහිත ව කොම්පෝස්ට් ගොඩ පෙරළීමෙන් ලැබෙන වාසි **තුනක්** නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(D) (i) විද්‍යාගාරයේ තිබී බීජ ඇසුරුම් හතරක් හමුවිය. මෙම ඇසුරුම්වල ලේබලවල වර්ණ පහත දී ඇත. එක් එක් ඇසුරුමේ බීජ පංතිය ලියන්න.

ලේබලයේ වර්ණය	බීජ පංතිය
(1) සුදු (රෝස පැහැති ඉරි දෙකක් සමග)	....
(2) සුදු	....
(3) ලා කොළ	....
(4) ලා නිල්	....

(ii) බීජ නියැදියක පහත සඳහන් මිනුම් ලබා ගන්නා ලදී.

බීජ නියැදියේ මුළු බර	=	ග්‍රෑම් 400
රෝග ලක්ෂණ දක්වන බීජවල බර	=	ග්‍රෑම් 15
අපරිණත බීජවල බර	=	ග්‍රෑම් 5
හිස් බීජ, හිස් පුෂ්පිකා හා දූවිලි ආදියේ බර	=	ග්‍රෑම් 3

ඉහත නියැදියේ "ශුද්ධ බීජ ප්‍රතිශතය" ගණනය කරන්න.

....

....

(E) (i) උත්ස්වේදනය හා වාෂ්පීකරණය අතර ප්‍රධාන වෙනස්කම් **තුනක්** නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(ii) උත්ස්වේදනයෙන් ශාකවලට අත්වන ප්‍රධාන වාසිය කුමක්ද?

....

....

03. (A) (i) "ස්ව පරාගණය" අර්ථ දක්වන්න.

....

....

....

(ii) ස්වපරාගණය සඳහා ශාක දක්වන අනුවර්තන **තුනක්** ලියන්න.

(1) ....

(2) ....

(3) ....

(B) (i) කැපූ මල් කර්මාන්තයේ දී ක්ෂුද්‍ර ප්‍රචාරණය බහුලව භාවිත කිරීමට බලපාන **එක්** ප්‍රධාන හේතුවක් ලියන්න.

....

....

(ii) මෑතක දී රජය විසින් එක්තරා වැදගත් ආහාර බෝගයක ක්ෂුද්‍ර ප්‍රචාරණය ප්‍රවර්ධනය කරන ලදී. මෙම බෝගය කුමක් ද?

....

Scanned with CamScanner

(iii) පටක රෝපණ මාධ්‍යයක අඩංගු වන ප්‍රධාන සංඝටක පහ ලැයිස්තු ගත කරන්න.

(1) ....

(2) ....

(3) ....

(4) ....

(5) ....

(C) (i) ගොවියෙකු සතු බෑවුම් සහිත ඉඩමක වාර්ෂික වල් පැළෑටි වැවී ඇත. මෙම භූමියේ වල් පැළ පාලනය සඳහා සුදුසු ක්‍රමයක් නම් කරන්න.

....

(ii) ක්‍රියාකාරීත්ව ආකාරය (mode of action) අනුව වල්නාශක වර්ගීකරණය කරන්න.

(1) ....

(2) ....

(D) (i) ව්‍යාප්ත වන ආකාරය අනුව වයිරස් රෝග වර්ගීකරණය කරන්න.

(1) ....

(2) ....

(3) ....

(ii) මයිටාවන් හා කෘමීන් අතර ප්‍රධාන වෙනස්කම් දෙකක් ලියන්න.

(1) ....

(2) ....

(E) සතියක් තුළ පාරිභෝගිකයෙකුගේ X හා Y භාණ්ඩ පරිභෝජන රටාව පහත රූප සටහනෙන් දැක්වේ.



(i) PP′, QQ′, RR′ හා SS′ වක්‍ර හඳුන්වන්න.

....

(ii) AB වක්‍රය හඳුන්වන්න.

....

(iii) C ලක්ෂ්‍යය යනු කුමක් ද?

....

Scanned with CamScanner

(iv) C ලක්ෂයේ ඇති වැදගත්කම කුමක් ද?

....

....

(v) C,AB ඔස්සේ D දක්වා විස්ථාපනය කළ විට කුමක් සිදුවේ ද?

....

....

(vi) $\frac{LL'}{MM'}$ කෙසේ අර්ථ දැක්විය හැකි ද?

....

....

04. (A) (i) කුකුළාගේ ප්‍රජනන පද්ධතියේ විවිධ කොටස් **තුනක්** නම් කර, එම එක් එක් කොටසින් කෙරෙන **එක්** ක්‍රියාවක් බැගින් නම් කරන්න.

	කොටසේ නම	ක්‍රියාව
(1)	....	....
(2)	....	....
(3)	....	....

(ii) එළදෙනගේ ප්‍රජනන පද්ධතියේ පහත සඳහන් එක් එක් කොටසින් කෙරෙන **එක්** ප්‍රධාන කාර්යය බැගින් ලැයිස්තු ගත කරන්න.

	කොටස	කාර්යය
(1)	භගය	....
(2)	ග්‍රීවය	....
(3)	ගර්භාෂය	....
(4)	පැලෝපීය නාලය	....

(iii) ගොවිපළ සතුන්ගේ මද සමායෝජනයේ වාසි **තුනක්** දක්වන්න.

(1) ....

(2) ....

(3) ....

(B) පහත ඇති ආහාර සංඝටකවල අඩංගු ප්‍රෝටීන් ප්‍රමාණය ලියා දක්වන්න.

	ආහාර සංඝටකය	ප්‍රෝටීන් %
(i)	පොල් පුන්නක්කු	....
(ii)	හාල් නිවුඩු	....
(iii)	මස් අත්නය	....
(iv)	මාළු අත්නය	....
(v)	සෝයා අත්නය	....

(C) පශු නිෂ්පාදනය දියුණු කිරීමට භාවිත කළ හැකි විවිධ අභිජනන ක්‍රම **තුනක්** දෙන්න.

(i) ....

(ii) ....

(iii) ....

(D) මැස්ටයිටිස් රෝගයේ ලක්ෂණ **හතරක්** ලැයිස්තුගත කරන්න.

(i) ....

(ii) ....

(iii) ....

(iv) ....

*** ** ***

Scanned with CamScanner

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2003 අප්‍රේල්

General Certificate of Education (Adv. Level) Examination, April 2003

කෘෂි විද්‍යාව II

Agricultural Science II

"B" කොටස - රචනා

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 15 කි.)

(i) පැහැදිලිව නම් කළ රූප සටහනක් ඇසුරෙන් ගවයාගේ ආහාර මාර්ග පද්ධතිය තුළ ආහාර ජීරණය වන අයුරු විස්තර කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය දියුණු කිරීම කෙරෙහි කෘත්‍රිම සිංචනයේ ඇති විභවය පැහැදිලි කරන්න.

(iii) ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලනයේ වර්තමාන ප්‍රවණතා කවරේ ද?

(i) ප්‍රධාන පාෂාණ ආකාර **තුන** කවරේ ද? පාෂාණවල රසායනික ජීරණය විස්තර කරන්න.

(ii) හේන් ගොවිතැන හේතුවෙන් සිදුවන පරිසර හානිය විස්තර කරන්න.

(iii) සංරක්ෂණයේ දී ආහාරවල සිදුවන රසායනික, භෞතික හා පෝෂණ වෙනස්කම් මොනවා දැයි උදාහරණ දෙමින් විස්තර කරන්න.

(i) වී වගාවේ නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තු කිරීමට භාවිත වන විචල්‍ය වියදම්වල ලැයිස්තුවක් සකස් කරන්න.

(ii) බෝග වගාවේ දී තාවකාලික ප්‍රචාරක ව්‍යුහ භාවිතය විස්තර කරන්න.

(iii) එළ කිරිවල හා මී කිරිවල සංයුතිය සංසන්දනය කරන්න. කිරිවල සංයුතිය කෙරෙහි බලපාන සාධක විස්තර කරන්න.

(i) කාබනික පොහොර මගින් පසෙහි රසායනික ගුණාංග හා භෞතික ගුණාංග වැඩිදියුණු කෙරෙන්නේ කෙසේ දැයි විස්තර කරන්න.

(ii) බිම් සැකසීම යනු කුමක් ද? විවිධ බිම් සැකසිම් ආකාර දක්වන්න.

(iii) කෘෂිකර්මයේදී භාවිත වන විවිධ ජල පොම්ප මාදිලි මොනවා ද? එක් එක් පොම්ප මාදිලියේ ඇති **වාසි** සහ **අවාසි** මොනවාද?

(i) බීජ ගබඩා කළ යුත්තේ ඇයි? ගබඩා කිරීම සඳහා බීජ සැකසිය යුත්තේ කෙසේද?

(ii) (a) ශාක සෛලයක පැහැදිලිව නම් කළ රූප සටහනක් අඳින්න.

(b) ශාක සෛලයේ ප්‍රධාන කොටස්වල කෘත්‍යයන් ලැයිස්තුගත කරන්න.

(iii) ආන්තික ආදායම යනු කුමක් ද? මෙය ලාභ උපරිම කිරීමේ දී යොදා ගත හැක්කේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

(i) ජාන සම්පත් සංරක්ෂණය යනු කුමක් ද? විවිධ ජාන සම්පත් සංරක්ෂණ ක්‍රම විස්තර කරන්න.

(ii) මිශ්‍ර බෝග වගාව යනු කුමක් ද? මිශ්‍ර බෝග වගාවේ **වාසි** සහ **අවාසි** මොනවාද?

(iii) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ප්‍රධාන පස් කාණ්ඩය රතු දුඹුරු පස වේ. රතු දුඹුරු පසෙහි වගා කිරීමේ දී ඇති වන ගැටලු මොනවා දැයි විස්තර කරන්න.

Scanned with CamScanner